බස්නාහිර පළාතේ පළාත් සභාව
மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

බස්නාහිර පළාතේ පළාත් සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත,

## සභා රැස්වීම

2013 ජූනි මස 04 වන දින කල් තැබීම අනුව, බස්නාහිර පළාතේ පළාත් සභාව 2013 ජූනි මස 18 වන දින පෙ.ව. 9.30 ට බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී රැස්වෙන බව කාරුණිකව දැනුම් දෙමි.

න්‍යාය පත්‍රය මේ සමඟ ඇත.

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013/06/ 04 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
## 2013 ජූනි මස 18 වන දින පෙ.ව 9.30ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු මංජු ශ්‍රී අරංගල විපක්ෂනායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් 2013.05.07 දින අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/V (01)13/07)

අ. කොළොන්නාව සමුපකාර සමිතියට සමුපකාර කොමසාරිස් විසින් පත්කර ඇති සභාපතිවරයාගේ අදූරදර්ශී ක්‍රියාපිළිවෙත හේතුවෙන් රන් සම්මානයෙන් පිදුම්ලද, සමිතිය පරිහානියට ලක්වෙමින් පවතින බව පිළිගන්නේද?

ආ. සභාපතිවරයා සමුපකාරය සතු වාහන ඇතුළු දේපළ අයථා ලෙස පරිහරණය කරන බව පිළිගන්නේද ?

ඇ. පාරිභෝගික හා ග්‍රාමීය බැංකු අංශ මුලා කඩාවැටීමකට ලක්ව ඇති බව පිළිගන්නේද?

ඇ. බැංකු තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම් සේවක වැටුප් ගෙවීම් අර්බුදයකට පත්ව ඇති බව පිළිගන්නේද?

ඉ. ග්‍රාමීය බැංකු අංශයෙන් සමිතිය වසර 02කට ලබාගෙන ඇති රුපියල් ලක්ෂ 300ක ණය මුදලේ පොලිය හා වාරික රු.5914201/- ගෙවා අයිරාව රුපියල් ලක්ෂ 500 දක්වා වැඩිකර වසර 10කින් ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කරගෙන ඇති බව පිළිගන්නේද ?

ඊ. 2012.12.31 දිනට සමිතියේ ශුද්ධ පාඩුව රු.1,012,132/- බව පිළිගන්නේද ?

උ. ජාතික සමුපකාර මණ්ඩලයේ තැන්පත් කර තිබූ ග්‍රාමීය බැංකු තැන්පතුව රු.17,688,652/-ක මුදල කල්පිරීම හේතුවෙන් කොළොන්නාව මහජන බැංකුවේ ජංගම ගිණුමක තැන්පත් කළ බව පිළිගන්නේද?

ඌ. එම මුදල්ද වියදම් කර අවසන් බව පිළිගන්නේද?

එ. මෙම නිලධාරීන් සමිතියේ සියලු වත්කම් විනාශ කරන තෙක් සිටින්නේද?

ඒ. සමිතිය සඳහා නිලවරණයක් නොපවත්වන්නේ මන්ද?

02. ගරු මංජු ශ්‍රී අරංගල විපක්ෂනායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් 2013.05.07 දින අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/V (01)13/08)

අ. කොළොන්නාව සමුපකාර සමිතියට නෙස්ලේ නියෝජිතත්වයක් හිමිව තිබූ බව පිළිගන්නේද?

ආ. සමිතිය සතුවූ නෙස්ලේ නියෝජිතත්වය අහිමි වී ඇති බව පිළිගන්නේද ?

ඇ. නෙස්ලේ බිල්පත් පියවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ග්‍රාමීය බැංකු අංශයෙන් රුපියල් ලක්ෂ 485ක් පාරිභෝගික අංශයට මාරුකර ඇති බව පිළිගන්නේද?

ඈ. සමිතිය සතු රුපියල් ලක්ෂ 80ක් පමණ වටිනා නෙස්ලේ නිෂ්පාදන නෙස්ලේ ආයතනයට භාරනොදී සමිතියේ ගබඩාකර ඇති බව පිළිගන්නේද?

ඉ. ගබඩාව තුළදීම එම භාණ්ඩ කල්ඉකුත්වී පරිභෝජනයට ගත නොහැකි භාණ්ඩ තත්වයට පත්වන බව පිළිගන්නේද ?

ඊ. මෙම භාණ්ඩ වෙනුවෙන් දිනකට රු.15,000/- ක දඩයක් නෙස්ලේ සමාගම වෙත ගෙවිය යුතු බව පිළිගන්නේද ?

උ. සමිතිය මෙම භාණ්ඩ භාරදී මෙම බැඳීම් වලින් නිදහස් නොවන්නේ මන්ද?

03. ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සමාජ සුභසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට : (ප්‍ර/v(1)13/09)

අ. කළුතර සෞඛ්‍ය වෛද්‍ය අධිකාරි කාර්යාලයෙන් පාලනය වන මෝල්කාව මධ්‍යම බෙහෙත් ශාලාව ඉතා දුෂ්කර ප්‍රදේශයක පිහිටි මහජනතාවට අත්‍යාවශ්‍ය බෙහෙත් ශාලාවක් බව ඔබතුමා දන්නෙහි ද ?

ආ. එම මධ්‍යම බෙහෙත් ශාලාවෙහි වහළය, දොරවල් දිරාපත් වී කැසිකිළි පද්ධතිය අක්‍රිය වී, පානීය ජලය සඳහා ඇති ළිඳ අපවිත්‍ර වී, සිවිලිම කඩා වැටෙමින් පවතින බව ඔබතුමා දන්නෙහිද ?

ඇ. විශාල පිරිසක් සතියකට දෙවරක් ප්‍රතිකාර ලබා ගන්නා මෙම මධ්‍යම බෙහෙත් ශාලාව ප්‍රතිසංස්කරණය කර පාවිච්චියට සුදුසු තත්වයට පත් කල යුතු බව ඔබතුමා පිළිගන්නේද ?

ඈ. එසේ පිළිගන්නේ නම් ඔබතුමා මෙතෙක් ඒ සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද ?

ඉ. එසේ ක්‍රියාමාර්ග ගෙන නොමැතිනම් ඒ කුමක් නිසාද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

" අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය . "

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

1. ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා :

*"නැණ ගුණ වැඩුම"* මහින්ද චින්තන ප්‍රතිපත්තිය අනුව යමින්, 2005 වසරේ සිට උපාධිධාරීන් සුවිශාල සංඛ්‍යාවකට බස්නාහිර පළාත් රාජ්‍ය සේවය තුළ ගුරු පත්වීම් ලබා දීම කාගේත් ප්‍රශංසාවට ලක්වන්නකි.

විවිධ විෂය ක්ෂේත්‍රයන්ගෙන් උපාධිලත් උපාධිධාරීන් වන මෙම ගුරුවරුන් විසින් දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය උදෙසා ලබා දෙන දායකත්වය මෙම ගරු සභාව අගය කරන අතර, ඔවුන්ගේ වෘත්තිය නිපුනත්වය වර්ධනය කර ගනිමින් සේවා උසස්වීම් කරා යාමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට මංපෙත් විවෘත කළ යුතු යැයිද, එම ගුරුවරුන්හට උපාධියට හදාරන ලද විෂයයන්ම ඉගැන්වීමට අවශ්‍ය අවස්ථාව සලසා දී එමගින් වඩාත් තෘප්තිමත් ගුරු පරපුරක් බිහි කිරීමට හේතුවන පරිදි අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කළ යුතු යැයිද බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි." (යෝ/v(01)13/01)

## XI. පොදු කටයුතු

01. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

### ත්‍රීරෝද රථ නාවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
### (කළුතර ප්‍රාදේශීය සභාව)

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ කළුතර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද කළුතර ප්‍රාදේශීය සභාවේ - *"ත්‍රීරෝද රථ නාවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"* නම්වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1725/16 දරණ හා 2011.09.29 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන්නට යෙදුන අතර,

එහි අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කරමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි. "

අදාළ ලිපිලේඛන 2013.06.04 දිනැති සභා න්‍යාය පත්‍රය සමගම සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සලස්වා ඇත

02. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් කරනු ලැබීමට,

නගර සහා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2වැනි වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද,

නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

(අදාල ලිපිලේඛන 2013.06.04 දිනැති සභා න්‍යාය පත්‍රය සමඟම සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සළස්වා ඇත)

03. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන. මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද,

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

(අදාල ලිපිලේඛන 2013.06.04 දිනැති සභා න්‍යාය පත්‍රය සමගම සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සලස්වා ඇත)

04. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

(පානදුර නගර සභාව)

255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 157 (14 අ) වන උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 153 වන වගන්තිය යටතේ පානදුර නගර සභාව විසින් සාදන ලද පානදුර නගර සභාවේ - *"ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"* නම්වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු වූ 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 154 වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1783/39 දරණ 2012 නොවැම්බර් මස 09 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,

එහි අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කර සිටිමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 156 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි.

(අදාල ලිපිලේඛන 2013.06.04 දිනැති සභා න්‍යාය පත්‍රය සමගම සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සලස්වා ඇත)

05. ගරු මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය.

*'2013 අංක ................. දරණ බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය.'*

(පළමුවර කියැවීම)

[1989 අංක 04 දරණ බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහාවූ ප්‍රඥප්තියකි.]

06. ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන හා කාන්තා කටයුතු පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා (බ.ප.)

*'බස්නාහිර පළාතේ 2012 අංක ............... දරණ දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය'*

(දෙවනවර කියැවීම)

[ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියැවීම 2013.05.21 දින සිදුකර ඇත.]

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.06.11 දින
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
5 වන මහළ, බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.